# හරිත සම්පත රකිමින් දැයේ සම්පත් සුරකිමු

ශ්‍රී ලංකාවේ රටේ ජීවනාලිය ස්වභාවික පරිසරයයි. ස්වභාවික පරිසරය අතරින් වෘක්ෂලතාවලින් ගහන හරිත පරිසරයට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. මන්ද, මිනිසාගේ හා ජීවීන්ගේ පැවැත්ම ප්‍රධාන වශයෙන් පවතින්නේ හරිත පරිසරය නිසාවෙනි. තව ද හරිත පරිසරය තුළින් මිනිසා හා ජීවීන්ගේ පැවැත්ම පවත්නා සේම පාංශු පෝෂකත්වය, පාංශු සංරක්ෂණය, ජල සංරක්ෂණය ද සිදු වේ.

කෙසේ වුව ද, එදිනෙදා සිදුවන මිනිසාගේ හා ජීවීන්ගේ වර්ධනය හේතුවෙන් පරිසර විනාශයට මඟ සැදී ඇත. මේ නිසා මතු පරපුරට සිදුවන අසාධාරණයට වග කිව යුත්තෝ ද අපි වෙමු. වන විනාශය හේතුවෙන් රට තුළ පවත්නා දේශගුණික විපර්යාස තුළින් නියඟය ඇතිවීම, ජල ගැල්ම, නාය යෑම් වැනි ස්වභාවික විපත්වලට මුහුණදීමට සිදුවීම කාලීනව මේ දක්වා ඉහළ ගොස් ඇත.

එමෙන්ම, ගංගා සිඳීයාම, ගංගා ආශ්‍රිත වැව් අමුණු ගොඩවීම ආදිය සිදු වේ. මෙම ගොඩවීම් තුළින් වගාවන් සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය එහි වැව් අමුණුවල තැන්පත්වීම හා එම ජලය භාවිතයෙන් නොයෙකුත් රෝගාබාධවලට ගොදුරු වන බැව් පර්යේෂණ තුළින් හඳුනා ගෙන තිබේ. මේ නිසා, පරිසරය සුරැකීමට හා රෝගාබාධ සඳහා ඖෂධවලට රජයට වැය කිරීමට සිදුවන මුදල් සම්භාරය අති මහත් වූවකි.

මෙම සියලු ම හේතු සාධක අප දැයේ නොනිමි මෙහෙවරක් රිසිසේ ඉටු කරන්නා වූ මී මැස්සාට අතිශයින් බලපා තිබේ. පරිසරයේ ඇති තුරුලතාවන්ගේ පැණි පරාග මත යැපෙන්නා වූ මී මැස්සාගෙන් ඉටු වන කාර්යභාරය පිළිබඳ දැන් අවධානය යොමුවන්නට පටන් ගෙන තිබේ. මී මැස්සා දැයේ සම්පතක් වූයේ කෙලෙස ද? මී මැස්සා මිනිසා ඇසුරු කරන්නට පටන් ගෙන ඇත්තේ මීට වසර දහස් ගණනකට ඉහත දී ය. ඈත අතීතයේ සිට වර්තමානය දක්වා මී මැස්සා පිළිබඳ පර්යේෂණාත්මක තොරතුරු තුළින් කලින් කලට එළි දකින්නට විය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් මී පැණිවල ගුණාත්මක අගයන්, මී මැස්සාගෙන් ලබා ගන්නා මී ඉටි, පැණි, පරාග, රාජ ජෙලී ඖෂධ සඳහා භාවිතා කරන ආකාරයන් පිළිබඳ තොරතුරු එළි දකින්නට විය. තව ද, බෝග පරාගනය හේතුවෙන් බෝග අස්වැන්න වැඩිවීම හා අමතර ආදායමක් ලබා දෙන හෙයින් ද, පවුල් පරිසරයේ ඇති වෙනස්වීම්වලට තුඩු දෙන සාධකයක් හෙයින් ද මී මැස්සන් ඇති කිරීම සඳහා වැඩි වශයෙන් නැඹුරුවීම වර්තමානයේ රටේ පවත්නා සැබෑ තත්ත්වයයි.

තව ද, මී මැසි පෙට්ටි නිෂ්පාදනය, ජනපද වැඩි කිරීම, දනට රටේ පවත්නා මී පැණි සඳහා ඉල්ලුම සපුරාලීමට ද රටේ පවත්නා පරිසර තත්ත්ව තුළින් ගොඩ නැඟිය හැකි බැව් රජය හා පෞද්ගලික අංශයේ අවධානය යොමු වී තිබේ. එමෙන්ම, ශ්‍රී ලංකාවේ පාසල් හැර, යන දරුවන්ගේ හා දුප්පත් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා ස්වයං රැකියා උත්පාදනය කළ හැකි අංශයක් වශයෙන් ද අවධානය යොමු වී ඇත.

එසේ නම්, හරිත පරිසරය සුරැකිය යුතුය. දැයේ සම්පතක් බඳු වූ මී මැස්සා වෙනුවෙන් ගසක් සිටුවීම කෘතවේදීත්වය පල කිරීමක් මෙන්ම රටේ අනාගතයට ද ඵලදායක ආයෝජනයකි. මී මැස්සන් ඇති කිරීමෙන් ඵලදායීතාවය වැඩි කර ගත හැකිය. මී මැස්සා සුරකින ජාතියක් බවට නොපමාව පත් වීම සැබැවින්ම කාලීන අවශ්‍යතාවයකි.

**එම්.ඩබ්.පී. ජයමාන්න**
**මුලස්ථාන කෘෂිකර්ම උපදේශක**
**මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව**
**බණ්ඩාරවෙල**